Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School



# 6. ශබ්දය හා ඇසීම

- **ශබ්ද නිපදවීම**

ක්‍රියාකාරකම 1

- නිවසින් පිටතට ගොස් පැය භාගයක පමණ කාලයක් ගෙවත්තේ, පරිසරයේ ඇවිදිමින් ඔබට ඇසෙන ශබ්දවලට හොඳින් සවන් දී ඒවා ලැයිස්තුවක් පිළියෙල කරන්න.
  උදා : සතුන්ගේ නාද , මිනිසුන්ගේ කටහඬ ....

ක්‍රියාකාරකම 2

- ඔබ නගරයට ගියහොත් ඔබට ඇසෙන ශබ්ද ලැයිස්තු ගත කරන්න.

ක්‍රියාකාරකම 3

- බයිසිකලයක සීනුවක් නාදකර, එය නාදවන අවස්තාවේ සීනුව මත ඇඟිල්ලක් තබා එවිට ඔබට දැනෙන දේවල් ලියන්න.

ක්‍රියාකාරකම 4

- බැලුන් පටලයක් ආධාරයෙන් කුඩා රබානක් නිර්මානය කර හෝ නිවසේ ඇති රබානක් හෝ වාදනය කරන්න.
- වාදනය කරන අතරතුර කුඩා කඩදාසි කැබලි කීපයක් බැලුන් පටලය හෝ රබානේ සම් පටලය මත තබන්න. නිරීක්ෂණ ලියන්න.